නොදුරු දිනයක දී ලොවක් හොල්ලන මැජික් බිට් භාවිතයෙන්
ආර්ඩියුනෝ සමඟ

# රොබෝ තාක්ෂණය

**With Arduino using Magicbit that will shake the world one day**

# Let's Study Robotics

DISHANT YAPA

## කර්තෘගේ වෙනත් කෘතීන් .... ✍

- පරිගණකය ඉගෙනුමට පහසුම මග
  - 2017 වර්ෂයේ නොවැම්බර් මස ISBN 978-955-29-0736-4
- ස්මාර්ට් ජංගම දුරකථන අලුත්වැඩියාව, නඩත්තුව සහ එහි විකාශනය
  - 2018 වර්ෂයේ මාර්තු මස ISBN 978-955-29-0792-0
- SME ව්‍යාපාරිකයින් සඳහා ඊ-වානිජ්‍යයේ වැදගත්කම
  - 2018 වර්ෂයේ සැප්තැම්බර් මස ISBN 978-955-29-0736-4
- පරිගණක ජාල ආරක්ෂාව සහ හැක් කිරීමේ ආචාරධර්ම
  - 2021 වර්ෂයේ සැප්තැම්බර් මස ISBN 978-955-31-2028-1

DISHANT YAPA

## පොත ගැන....

තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමඟම මානව කටයුතු පහසු කර ගැනීම සඳහා අද ලොව නන්දෙසින් රොබෝ තාක්ෂණයේ භාවිතාව පිළිබඳ නොයෙකුත් තොරතුරු අපට අසන්නට ලැබෙනු ඇත. එනම් රොබෝ තාක්ෂණයේ ප්‍රවේශය අප වටා ඇති සියලු ක්ෂේත්‍ර වෙත වඩ වඩාත් නැඹුරු වීම සිදු වනු ඇත. ඉතා සංකීර්ණ කාර්යයන් ඉතා පහසුවෙන් ඉටු කර දීමට මෙම රොබෝ යන්ත්‍ර වලට හැකියාව තිබේ. 2030 වසර වන විට ලොව පුරා කර්මාන්ත අංශයේ රැකියා මිලියන 20ක් පමණ රොබෝවරුන් මගින් සිදු කරනු ඇතැයි "ඔක්ස්ෆර්ඩ් ඉකොනොමික්ස් (Oxford Economics)" මගින් සිදු කළ සමීක්ෂණයකින් හෙළි වී තිබේ.

අද විද්‍යාව හා ඒ හා සබැඳි විෂයන් පිළිබඳව ළමයින් තුළ ඇත්තේ සෘණාත්මක ප්‍රතිරූපයකි. එය හුදු පාඩම් කළ යුතු, විෂය නිර්දේශයකට නතු වූ තවත් එක් විෂයක් ලෙස ලඝු කරනු විනා එය ලෝකය දකින මගක් ලෙස තේරුම් ගැනීමට ළමා මනසට අද නො හැකි වීම අභාග්‍යයකි. එබැවින් විද්‍යාව යනු පොත පත දැනුමට පමණක් සීමා වූ නිර්වචන හා සමීකරණ සමූහයක් නො වන වග අවබෝධ කර ගත් ළමයින් ඇත්තේ අද අතළොස්සකි.

පාසල් යන වයසේ දරු දැරියන්ට සහ රොබෝ තාක්ෂණය පිළිබඳ වඩාත් ඇල්මක් ඇති සියලු ම අය වෙනු වෙන් රොබෝ තාක්ෂණය නිවැරදිව භාවිතයට ගනු ලබන අයුරු සහ එය භාවිතයේ දී පැන නැගුණු ලබන ගැටලු සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ වත් මා මෙම පොතෙහි මනාව පැහැදිලි කර දී ඇත.

මෙම ක්ෂේත්‍රය හා සබැඳි දැනුම, ආකල්ප, කුසලතා හා ප්‍රායෝගික ශිල්ප ක්‍රම පුහුණු වෙමින් අනාගත වැඩ ලෝකයෙහි අභියෝගවලට මුහුණ දීම සඳහා සිසු දරු පරපුර සූදානම් කර වීම අප සතු එක් වගකීමකි. ඔවුන්ගේ නිර්මාණාත්මක කෞශල්‍ය (Innovative skills) ඔප් නැංවීම අරමුණු කර ගනිමින් හා අධ්‍යාපන අමාත්‍යාංශ විසින් 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ඇති සිසුන් සඳහා වාර්ෂිකව පවත්වනු ලබන සමස්ත ලංකා පාසල් රොබෝ තාක්ෂණ තරගාවලියට ඉදිරිපත් වීම සඳහා අත්වැලක් මෙම ග්‍රන්ථය හරහා ඔබට ලැබේවා යැයි මා ගේ ප්‍රාර්ථනාවයි.

ඩිෂාන්ට් යාපා

PGDip (UK), NDT (Electronics), MCP, MOS, ECDL(UK)

0772953717
නො.04, අරලිය උයන
මැදකන්ද පාර, මත්තේගොඩ

2023 ජූලි මස 31 වැනිදා ය.

DISHANT YAPA

## මෙම පොතෙහි අඩංගු කරුණු


### 01 රෝබෝ තාක්ෂණය පිළිබඳ හැඳින්වීම Introduction to Robotics

- රොබෝවක් යනු කුමක්ද? What is a Robot?
- රොබෝවරුන් යොදා ගැනීමේ ප්‍රධාන අරමුණු The main purpose of robots
- රොබෝවරු වර්ගීකරණය Types of Robots
- ක්‍රියාකාරකම

### 02 රොබෝ තාක්ෂණයේ ආරම්භය සහ එහි ඉතිහාසය The evolution of robots

- ක්‍රියාකාරකම

### 03 මූලික ඉලෙක්ට්‍රොනික කොටස් හඳුනා ගැනීම Identifying basic electronic components

- ඉලෙක්ට්‍රොනික්ස් යනු කුමක්ද? What is a Electronics? ❍ විදුලි තරංග Electrical Waves
- ධාරාව මනිනු ලබන්නේ කෙසේද? How is current measured?
- බහු-මීටරය Multimeter
- මල්ටි මීටරයක් භාවිතයෙන් පරිපථයක වෝල්ටීයතාව සහ ධාරාව මනින අයුරු
- ප්‍රතිරෝධක Resistor ❍ ප්‍රතිරෝධක වර්ග කිරීම Types of Resistor
- ඕම්ස් ගේ නියමය Ohm's Law
- ශ්‍රේණිගත පරිපථ Series Circuit
- ප්‍රතිරෝධවල අගය හඳුනා ගැනීම Color code of the resistor
- ධාරිත්‍රක/ කොන්ඩෙන්සර් - Capacitors
- ධාරිත්‍රක වර්ග Types of Capacitors
- ඩයෝඩය Diode ❍ LED ඩයෝඩය LED Diode
- ක්‍රියාකාරී සහ උදාසීන සංරචක අතර වෙනස
- ට්‍රාන්සිස්ටරය Transistor ❍ ට්‍රාන්සිස්ටර වර්ග Types of Transistors
- ප්‍රේරක Inductors ❍ ප්‍රේරක වර්ග Types of Inductors ❍ ඔසිලේටර/ දෝලක Oscillator
- සංවෘත පරිපථ Integrated Circuit
- ක්‍රියාකාරකම

### 04 දෝෂ නිරාකරණය Circuit Troubleshooting

- පරිපථ සංකේත හඳුනා ගැනීම - Circuit (CKT) Symbol
- How to operate the Push button?
- බල සැපයුම සහ රොබෝ බල ප්‍රභවයන් Power Supply and Robot Power Sources
- ඉලෙක්ට්‍රොනික පරිපථ තුල වයර් සම්බන්ධව ඇති අයුරු
- මූලික ඉලෙක්ට්‍රොනික සංරචක පරීක්ෂාව How to check Basic Electronic Components
- පෑස්සුම් උපකරණය භාවිතය How to use Soldering Iron
- Circuits in Tinkercad

### 05 රොබෝවරුන්ගේ චලනය Movements of Robots

- රොබෝවරු යොදා ගන්නා රෝද වර්ග Types of wheels for robots
- රොබෝ යන්ත්‍රයක් චලනය කිරීම Robot locomotion
- Robotic Arm

### 06 රොබෝ යන්ත්‍රයක විවිධ කොටස් Parts of the Robot

- විවිධ වර්ගවල විදුලි චලන Different types of DC actuators
- කාර්මික රොබොවරුන්ගේ ප්‍රධාන කොටස් Industrial robot parts
- ක්‍රියාකාරකම

### 07 රොබෝ සංවේදක Sensors of the robots

- සංවේදකයක් යනු කුමක්ද? What is a sensor?
- රොබෝ සංවේදක වර්ග සහ ඒවායේ ක්‍රියාකාරීත්වය Types of robot sensors and their function


DISHANT YAPA

08 රොබෝ යන්ත්‍ර සඳහා භාවිතා කරන මයික්‍රොකොන්ට්‍රෝලය
- ක්ෂුද්‍ර පාලකයේ අභ්‍යන්තරය Inside the Microcontroller
- ක්‍රියාකාරකම

09 රොබෝ යන්ත්‍ර සඳහා ආර්ඩියුනෝ භාවිතය (Arduino for Robots)
- ආර්ඩුයිනෝ යනු කුමක්ද? (What is Arduino?)
- ආර්ඩුයිනෝ යුනෝ භාවිතයට ගනු ලබන ක්ෂුද්‍ර පාලකය Microcontroller in the Arduino UNO
- විවිධ වර්ගයේ ආර්ඩියුනෝ පුවරු Different types of Arduino boards

10 රොබෝ යන්ත්‍ර සඳහා මැජික්බිට් මයික්‍රොකොන්ට්‍රෝලය
- මැජික්බිට් යනු කුමක්ද? What is Magicbit
- මැජික්බිට් ක්ෂුද්‍ර පාලකයේ ඇති වැදගත්කම් Highlights of Magicbit Microcontroller
- මැජික්බිට් හි අභ්‍යන්තරය Inside the Magicbit
- Arduino Uno vs Magicbit අතර ඇති වෙනස
- මැජික්බිට් පුවරු හා සම්බන්ධ වන ප්ලග-ඉන් මොඩියුල හඳුනා ගනිමු
- ක්‍රියාකාරකම

11 Arduino IDE මෘදුකාංගය භාවිත කරන අයුරු

12 මැජික්බිට් uploder මෘදුකාංගය භාවිතා කරන අයුරු
- Arduino IDE මෘදුකාංගය සමග Magicbit පුවරුව install සහ configure කර ගැනීම
- Project 1: Blink the LED bulb using Magicbit

13 වැඩසටහන් සඳහා කේත ලිවීම Writing the code
- කේතීකරණය යනු කුමක්ද? What is Coding?
- ආර්ඩියුනෝ භාවිතයෙන් වැඩසටහනක් ලියන අයුරු How to write a program on Arduino IDE
- LED නිවී නිවී දැල්වීම සඳහා කේතනය කිරීම Coding for blink a LED
- Project 2: Blink a LED with digital write

14 විචල්‍යයක් යනු කුමක්ද? What is a Variable?
- ආර්ඩුයිනෝ IDE මෘදුකාංගය විචල්‍ය සමග භාවිතා කරන්නේ කෙසේද?
- ආර්ඩියුනෝ හි බහුලව දැකිය හැකි දත්ත වර්ග
- Loops and Conditionals භාවිත කරන අයුරු
- Project 3 - Push Button ස්විච්චයක් මඟින් LED බල්බයක් on/ off කරමු
- Project 4 - බොත්තම එබීම හරහා අනුක්‍රමික සන්නිවේදනය ක්‍රියා කරන අයුරු
- Project 5: Reading an Analog Signal using a potentiometer

15 OLED දර්ශන තිර OLED Screen
- Project 6: Display text, logos, and images on the OLED screen
- OLED තිරය මත අක්ෂර, සරල සංකේත සහ රූප ප්‍රදර්ශනය කිරීම

16 Pulse with Modulation (PWM)
- Project 7: Controlling the light (analog signal) in a bulb
- Project 8: ON/ OFF the DC motor මෝටරය ක්‍රියාකර වීම
- Project 9: Controlling speed of the DC motor මෝටරයක වේගය පාලනය කිරීම


DISHANT YAPA

17 බසරයකින් නාද උත්පාදනය කරන අයුරු

- Project 10: Learning to generate a tone using the onboard buzzer මැජික්බිට් භාවිතයෙන් ස්වරයක් උත්පාදනය කිරීම

18 What is RGB Module

- Project 11: Change colors of RGB LED as required අවශ්‍ය පරිදි RGB LED වල වර්ණයන් වෙනස් කරන්න

19 අතිධ්වනික සංවේදක මොඩියුලය භාවිතා කරන්නේ කෙසේද How to use Ultrasonic sensor module

- Project 12: Getting outputs of distances by the HC-SR04 ultrasonic sensor HC-SR04 අතිධ්වනික සංවේදකය මඟින් දුර ප්‍රතිදානයක් ලෙස ලබා ගැනීම

20 Use of the IR LED module IR LED මොඩියුලය භාවිතා කිරීම

- Project 14: Switching LED on and off using remote control

21 LDR Sensor මොඩියුලය භාවිතා කිරීම

- Project 15: Prints the value of the LDR reading
- Project 16: On and OFF the LED according to reading of the LDR sensor

22 IR Proximity Sensor භාවිතා කිරීම

- Project 17: Detect distance from a proximity (IR) sensor සමීප සංවේදකය භාවිතා කරන්නේ කෙසේද?

23 Servo Motor

- Project 18: Servo motor works on the PWM

24 Different types of arduino robot car chassis විවිධ වර්ගයේ arduino රොබෝ කාර් චැසි

- රෝද දෙකේ රොබෝ කාර් කට්ටලයක් සඳහා එකලස් කිරීමේ උපදෙස්

25 Motor Driver Module

- L9110 motor driver
- Project 19: Use inbuilt motor driver to control two motors

26 Bluetooth control car

- What is Bluetooth
- Project 20: Bluetooth control LED ON and OFF
- Project 21: Bluetooth control OLED display LED ON and OFF
- Project 22: Bluetooth control car using Magicbit බ්ලූටූත් රොබෝ රථය

27 රැහැන් රහිත මාධ්‍ය Wireless media

28 Line Following 2WD Robot Car රේඛාවක් මත ගමන් කරනු ලබන රොබෝ රථය

- Project 24: Line follwing robot

29 Arduino obstacle avoiding robot car using ultrasonic sensor

- Project 25: Ultrasonic robot
- Obstacle avoiding robot car using ultrasonic sensor and servo motor
- Project 26: Ultrasonic robot with servo motor

DISHANT YAPA

# 1 Introduction to Robotics
## රොබෝ තාක්ෂණය පිළිබඳ හැඳින්වීම



## රොබෝවක් යනු කුමක්ද? What is a Robot?

රොබෝවක් යනු සංකීර්ණ ක්‍රියාවන් ස්වයංක්‍රීය ව සිදු කිරීමට හැකියාව ඇති යන්ත්‍රයකි. Robot is a machine capable of performing complex tasks automatically.

- රොබෝ යනු යන්ත්‍රයකි, විශේෂයෙන් ම පරිගණකයක් කේතකරණයට ලක් කර සංකීර්ණ ක්‍රියාදාම මාලාවක් ස්වයංක්‍රීය ව ක්‍රියාත්මක කළ හැකි යන්ත්‍රයකි.

- එය නැවත නැවතත් කේතකරණයට ලක් කළ හැකි බහු ක්‍රියාකාරී සහ පරිසරයට සංවේදීතාවය දක්වන විද්‍යුත් යාන්ත්‍රික උපාංගයකි.

DISHANT YAPA

## රොබෝ නාමය සඳහා විද්‍යාත්මක පාරිභාෂිතය



**Robot -**
ස්වයංක්‍රීයව හෝ දුරස්ථ පාලකයක් මගින් මිනිස් කාර්යයන් ඉටු කරන යාන්ත්‍රික උපාංගයකි.



**Telerobotics -**
දුරස්ථ ව ක්‍රියාත්මක වන රොබෝ යන්ත්‍ර පිළිබඳ මේ නමින් හඳුන්වයි.



**Robotics -**
රොබෝ තාක්ෂණය අධ්‍යයනය කිරීම සහ එහි යෙදවීම මෙම නමින් හඳුන්වයි.



**Roboteer -**
රොබෝ යන්ත්‍ර සැලසුම් කරන හෝ ඒවා තනන පුද්ගලයන් මේ නමින් හඳුන්වයි.



**Roboticist -**
රොබෝවරුන් පිළිබඳ හෝ රොබෝ විද්‍යාව පිළිබඳ විශේෂඥයා මේ නමින් හඳුන්වයි.

අපට රොබෝවරු සිටීමේ දී ලැබෙන වාසි මොනවාද? (advantages of having robots in our lives)

අප මෙහි දී ඇයි අපට රොබෝවරු හෙවත් තාක්ෂණය අවශ්‍ය වනුයේ ? (why is robotics needed...?) යන්න සොයා බලමු. එහි දී එය මූලික කාරණා 4 ක් ඔස්සේ අපට අවශ්‍ය වන බව තහවුරු වී තිබේ.

1. වේගය (speed)
2. අන්තරායක/ අධික උෂ්ණත්වයන් හි වැඩ කිරීමට
3. එකම කාර්යය නැවත නැවතත් සිදු කිරීම (can do repetitive tasks)
4. නිරවද්‍යතාවයෙන් වැඩ කර ගැනීමටයි (can do work with accuracy)

## රොබෝවරුන් යොදා ගැනීමේ ප්‍රධාන අරමුණ The main purpose of robots

අද වන විට ලෝකයේ විවිධ කාර්යයන් සිදු කර ගැනීමට රොබෝවරු යොදා ගනු ලබයි. ඒ අතරින් පහත පරිදි විවිධ අරමුණු කිහිපයක් ඔබට පෙන්වා දිය හැකිය.

NISHANT YAPA



❍ මිනිසුන්ගේ මැදිහත්වීමකින් තොරව ස්වයංක්‍රීය ව කාර්යය ඉටු කර ගැනීම. Perform the task automatically without human intervention



❍ මිනිසුන්ට වඩා වේගයෙන් කාර්යයන් ඉටු කර ගැනීම සඳහා. To get things done faster than humans



❍ නැවත නැවතත් සිදු කිරීමට වන පුනරාවර්තන කාර්යයන් සිදු කර ගැනීම. To do repetitive tasks



❍ භයානක තත්ත්වයකට ලක් විය හැකි කාර්යයන් සිදු කර ගැනීම. Performing tasks that can lead to dangerous situations



❍ මිනිසාට එකවර කළ නොහැකි කාර්යයන් සිදු කර ගැනීම. Performing tasks that humans cannot do at once.



❍ ආබාධිත අයට උපකාර කිරීමට. Help the disabled (Handicapped)



❍ මිනිසුන්ට හට ළඟා විය නොහැකි ඉහළ මට්ටම් වල ඇති උපකරණ ක්‍රියාත්මක කිරීම. To operate equipment at high levels that are inaccessible to humans.



❍ ඉතා දුරින් පිහිටි ග්‍රහලෝක වෙත ළඟා වීම සඳහා.To reach distant planets.



❍ ඉතා ගැඹුරු පතල් තුලට ඇතුළු වීම සඳහා. To enter very deep mines.



❍ අපිරිසිදු කාර්යයන් සිදු කර ගැනීම. Doing dirty tasks.



❍ විවිධ ගවේෂණ කටයුතු සඳහා. For various exploration activities.



❍ විනෝදාස්වාදය සඳහා. For entertainment.



❍ ඉගැන්වීමේ ක්‍රියාවලියට. To the teaching process.



DISHANT YAPA

## රොබෝවරු යොදා ගනු ලබන කර්මාන්ත Robot used by industry



❍ Agriculture කෘෂිකර්මය ක්ෂේත්‍රය



❍ Construction ඉදිකිරීම් ක්ෂේත්‍රය



❍ Consumer goods
පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය



❍ Primary metals
ප්‍රාථමික ලෝහ භාණ්ඩ නිෂ්පාදනය



❍ Fabricated metal manufacturing
පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන



❍ Electronics/ precision equipment
ඉලෙක්ට්‍රොනික / නිරවද්‍ය උපකරණ නිෂ්පාදන



❍ Aerospace අභ්‍යවකාශය ගවේෂණ



❍ Mining and extractive
පතල් කැණීම සහ නිස්සාරණය ක්‍රියාවලි



❍ Electricity Generation
විදුලිබල උත්පාදනය ක්‍රියාවලි



❍ Non-metal primary commodities
ලෝහ නොවන ප්‍රාථමික වෙළඳ භාණ්ඩ සැකසීම

❍ Non-metal fabricated commodities ලෝහමය නොවන පිරිසැකසුම් භාණ්ඩ සැකසීම

❍ Machinery යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය ❍ Automotive වාහන නිෂ්පාදනය

DISHANTHA PA

## අයිසැක් ඇසිමෝව් තම විද්‍යා ප්‍රබන්ධවල රොබෝ යන්ත්‍ර වෙනුවෙන් හඳුන්වාදුන් නීති මාලව

1. පළමු නීතිය - රෝබෝ යන්ත්‍රය මිනිසාට හානියක් නො කළ යුතු අතර ක්‍රියා නො කර සිටීමෙන් හානියක් වීමට ඉඩ නොතැබිය යුතු ය.

2. දෙවැනි නීතිය - පළමුවැනි නියමය උල්ලංඝනය නො වන පරිදි මිනිසාගේ විධාන අනුගමනය කළ යුතු ය.

3. තුන්වැනි නීතිය - ඉහත නීති දෙක උල්ලංඝනය නො වන පරිදි තම පැවැත්ම රැක ගැනීමට කටයුතු කළ යුතු ය.




DISHANT YAPA

## රොබෝවරයෙකු අර්ථ දැක්වීම Definition of robot

සංවේදක, බුද්ධි/පාලන පද්ධති සහ ධාවක පද්ධති යන සංරචක තාක්ෂණයන් තුනෙන් සමන්විත බුද්ධිමත් යාන්ත්‍රික පද්ධතියකි.

### රොබෝ තාක්ෂණය ඉගෙනීම

රොබෝ විද්‍යාවේදී, මෘදුකාංග යනු රොබෝවරයාගේ චලනයන් සහ ක්‍රියාකාරකම් පාලනය කරන ක්‍රමලේඛන සහ ඇල්ගොරිතම ආදියයි. යම් කාර්යයක් ඉටු කිරීම සඳහා රොබෝවරයා අනුගමනය කරන උපදෙස් මෙන්ම, රොබෝවරයාට තීරණ ගැනීමට හෝ එහි ඇති පරිසරයෙන් යමක් ඉගෙන ගැනීමට හැකි වන පරිදි භාවිතා කරන ඕනෑම කෘත්‍රිම බුද්ධියක් හෝ යන්ත්‍ර ඉගෙනුම් පද්ධති මෙයට ඇතුළත් වේ.



යාන්ත්‍ර විද්‍යාව ලෙස රොබෝවරයාගේ භෞතික සංරචක හෙවත් සන්ධි, මෝටර සහ එහි ක්‍රියාකාරක වැනි දෑ යොදා ගනිමින් චලනය වීමට ඉඩ සලසා දෙනු ඇත. මෙයට රොබෝවරයාගේ ශරීරය, අත් සහ පාද වැනි දේ මෙන්ම එය අවට පරිසරය සංවේදනය කිරීමට හෝ හැසිරවීමට භාවිතා කරන ඕනෑම සංවේදක හෝ වෙනත් උපකරණ ඇතුළත් වේ.

අවසාන වශයෙන්, ඉලෙක්ට්‍රොනික් යනු රොබෝව බලගන්වන සහ වෙනත් උපාංග සමග සන්නිවේදනය කිරීමට ඉඩ සලසන විද්‍යුත් සංරචක වේ. රොබෝවරයාගේ බල ප්‍රභවය (බැටරි හෝ විදුලි රැහැනක් වැනි) මෙන්ම එහි චලනයන් පාලනය කිරීමට හෝ තොරතුරු සැකසීමට භාවිතා කරන ඕනෑම ඉලෙක්ට්‍රොනික පරිපථ හෝ චිප් වැනි දේ මෙයට ඇතුළත් වේ.

මෙම මූලද්‍රව්‍ය සියල්ල හෙවත් මෘදුකාංග, යාන්ත්‍ර විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික මගින් කාර්යයන් ඉටු කිරීමට සහ එහි පරිසරය සමග අන්තර් ක්‍රියා කිරීමට හැකි ක්‍රියාකාරී රොබෝවක් නිර්මාණය කිරීමට දායක වනු ඇත.




DISHANT YAPA

## රොබෝ වර්ගීකරණය Types of Robots

පහත පෙන්වා දී ඇති අයුරින් විවිධ වර්ගවල රොබෝ යන්ත්‍ර අපට එදිනෙදා දැකිය හැකි ය.




American George Devol is developed the world's first digitally operated industrial programmable robot "arm".
1954
"Father of Robotics"
American Joseph Engelberger, created the world's first industrial robot.
1956
The world's first industrial robot was installed in a car manufacturing plant called American General Motors.
1962
Japan made industrial robots called the Kawasaki-Unimate 2000.
1969
Wabot-1, the world's first full-scale human robot, was created in Japan
1973
Star Wars began creating robots.
1977
Educational robots called LEGO Mindstorms were released
1986
Japan's Sony launches four-legged robot called "AIBO"
1999
ASIMO, a humanoid robot, was released by Honda in Japan.
2000
Boston Dynamics in the USA designed "Big Dog" robot. It can carry a weight of 150 kg.
2005
Hong Kong inventor, David Hanson created a robot similar to the human body called Sophia.
2016
Engineered Arts British company designer and manufacturer of interactive humanoid entertainment robots called Ameca.
2022


"You know what?" Mr. Engelberger recalled remarking. "That sounds like a robot to me."
American physicist, engineer, and entrepreneur, Joseph F. Engelberger, dide on December 1, 2015
FATHER OF ROBOTICS
He licensed the patent of George Devol. Developing the first industrial robot : the Unimate. And gaining him the global recognition as the Father of Robotics in the mean time.
"I want the robot to fit in the same place a human does, and to do the same things the human does when he is involved in a subhuman task," he told the New York Times in 1980.
Joseph F. Engelberger with one of his robots in 1980

රොබෝ තාක්ෂණයේ පියා

**2005** වර්ෂය

The world's first self-replicating robot was developed by a team of researchers at Cornell University in the United States.

ලොව ප්‍රථම ස්වයං ප්‍රතිවලිතතාව සහිත රොබෝව නිපදවා ඇත්තේ එක්සත් ජනපදයේ කෝර්නෙල් විශ්ව විද්‍යාලයේ පර්යේෂකයන් කණ්ඩායමක් විසිනි. මෙය ස්වයංක්‍රීයව ප්‍රතිවලිතතාව කළ හැකි ස්වයංක්‍රීය රොබෝ වර්ගයකි.

එක්සත් ජනපදයේ බොස්ටන් ඩයිනමික්ස් නම් රොබෝ විද්‍යාව " Big Dog " ලෙස හැඳින්වේ. මෙම රොබෝවරුන්ට දුෂ්කර භූමි ප්‍රදේශයක ගමන් කළ හැකි අතර, හැකි තරම් වේගයෙන් නැගිට, පැයට සැතපුම් 4 ක වේගයෙන් ධාවනය කළ හැකි අතර බර කිලෝග්‍රෑම් 150 කි.







**2012** වර්ෂය

The world's first driverless Google’s self-driven cars were licensed in Nevada, USA.

ලොව ප්‍රථම රියදුරු රහිත ගුගල් ස්වයංක්‍රීය මෝටර් රථ සඳහා බලපත්‍ර ලබා දී ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ නෙවාඩා නගරයේ දීය.



**2016** වර්ෂය

හොංකොං හි නව නිපැයුම්කරුවෙකු වන ඩේවිඩ් හැන්සන් විසින් සොෆියා නම් මිනිස් සිරුරට සමාන රොබෝවක් නිර්මාණය කරන ලදී. මුහුණේ ඉරියව් 60කට වඩා පෙන්වීමේ හැකියාව ඇයට ඇත.



**2022** වර්ෂය

Engineered Arts British company is the UK's leading designer and manufacturer of interactive humanoid entertainment robots.

ඉන්ජිනියර්ඩ් ආර්ට්ස් බ්‍රිතාන්‍ය සමාගම එක්සත් රාජධානියේ ප්‍රමුඛතම නිර්මාණකරු සහ අන්තර් ක්‍රියාකාරී මානවරූපී විනෝදාස්වාද රොබෝ-වරු
නිෂ්පාදකයා වේ.

මෑතකදී, ඔවුන් Ameca නම් මිනිස් හැඩැති රොබෝවක් නිර්මාණය කර ඇති අතර එය මෙම වසරේ CES 2022 (පාරිභෝගික ඉලෙක්ට්‍රොනික ප්‍රදර්ශනය) සඳහා ඉදිරිපත් කරන ලදී.



DISHANT YAPA

## Activity

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. පළමු හියුමනොයිඩ් රොබෝව නිර්මාණය කළේ කවුද?
A. Leonardo da Vinci ලියනාඩෝ ඩා වින්චි
B Neil Armstrong නීල් ආම්ස්ට්‍රෝං
C. Dr. Frankenstein ආචාර්ය ෆ්‍රැන්කන්ස්ටයින්
D. Pinocchio පිනොචියෝ

2. රොබෝ විද්‍යාවේ නීති තුනෙන් එකක් නොවූයේ කුමක්ද?
A. Robots cannot harm humans රොබෝවරුන්ට මිනිසුන්ට හානි කළ නොහැක
B. Robots must obey human orders රොබෝවරු මිනිස් අණට කීකරු විය යුතුය
C. Robots must protect themselves රොබෝවරු තමන්ව ආරක්ෂා කර ගත යුතුයි
D. Robots cannot be big රොබෝවරු විශාල විය නොහැක



3. ප්‍රථම මානවරූපී රොබෝවරයා නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ කවුද?
A. Blaise Pascal බ්ලේස් පැස්කල්
B. Archimedes ආකිමිඩීස්
C. Thomas Edison තෝමස් එඩිසන්
D. Leonardo da Vinci ලියනාඩෝ ඩා වින්චි

4. රොබෝ තාක්ෂණය, යන යෙදුම මුලින්ම භාවිතා කළේ අයිසැක් අසිමොව්ය. ඔහුගේ රැකියාව කුමක්ද?
A. Scientist විද්‍යාඥයා
B. Inventor නව නිපැයුම්කරු
C. Science Fiction Writer විද්‍යා ප්‍රබන්ධ ලේඛකයෙක්
D. Movie Director චිත්‍රපට අධ්‍යක්ෂක



5. 1942 දී නිර්මාණය කළ පළමු වැඩසටහන් ගත කළ හැකි, යන්ත්‍රණය කුමක්ද?
A. A paint-sprayer තීන්ත ඉසින යන්ත්‍රයක්
B. A washing machine රෙදි සෝදන යන්ත්‍රයක්
C. A toy duck සෙල්ලම් තාරාවෙක්
D. A calculator ගණක යන්ත්‍රයක්

6. රොබෝ තාක්ෂණය වැදගත් වන්නේ ඇයි?
A. Robotics require you to read. රොබෝ තාක්ෂණය ඔබට කියවීමට අවශ්‍ය වේ.
B. Robotics is about creating healthy foods. රොබෝ තාක්ෂණය යනු සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදනය කිරීමයි.
C. Robots are fun to watch in movies රොබෝවරු චිත්‍රපට නැරඹීමට විනෝද වෙති.
D. Robotics produces robots and machines that do important work. රොබෝ තාක්ෂණය වැදගත් වැඩ කරන රොබෝවරුන් සහ යන්ත්‍ර නිෂ්පාදනය කරයි.

DISHANT YAPA

# 3

# Introduction to Basic Electronics
## මූලික ඉලෙක්ට්‍රොනික කොටස් හඳුනා ගැනීම



## ඉලෙක්ට්‍රොනික්ස් යනු කුමක්ද? What is a Electronics?

ඉලෙක්ට්‍රොනික විද්‍යාව යනු විද්‍යුත් (ඉලෙක්ට්‍රෝන ගලායාම) සහ පරිගණක වැනි දේ තැනීමට එය භාවිතා කරන ආකාරය අධ්‍යයනය කිරීමයි. එය ප්‍රයෝජනවත් දේවල් කිරීමට සංරචක සහ සම්බන්ධක වයර් ලෙස හැඳින්වෙන කොටස් වලින් සාදන ලද පරිපථ භාවිතා කරයි.

Electronics is the study of electricity (the flow of electrons) and how to use that to build things like computers. It uses circuits that are made with parts called components and connecting wires to do useful things.

### Father of Electronics



Michael Faraday (1873) was a British physicist and chemist who is best known for his discoveries of electromagnetic induction and of the laws of electrolysis. මයිකල් ෆැරඩේ (1873) යනු විද්‍යුත් චුම්භක ප්‍රේරණය සහ විද්‍යුත් විච්ඡේදනය පිළිබඳ ඔහුගේ සොයාගැනීම් සඳහා වඩාත් ප්‍රසිද්ධ වූ බ්‍රිතාන්‍ය භෞතික විද්‍යාඥයෙක් සහ රසායන විද්‍යාඥයෙකි.

DISHANT YAPA

## විදුලි තරංග Electrical Waves

Basic characteristics of a wave තරංගයක් මූලික ලක්ෂණ,

1. It has a constant speed. නියත වේගයක් ඇත.
2. There is an amplitude. තරංග විස්තාරයක් ඇත.
3. It has a wavelength. තරංග ආයාමයක් ඇත.



# ප්‍රතිරෝධක Resistor



විද්‍යුත් සන්නායක වල විදුලි ගමන වැළැක්වීම සඳහා බාධක ඇත. මෙම බාධක විද්‍යුත් ප්‍රතිරෝධය ලෙස හැඳින්වේ.

කම්බියක විද්‍යුත් ප්‍රතිරෝධය වැඩි නම් එහි ගමන් කරන විදුලි ධාරාව අඩුවේ. විද්‍යුත් ප්‍රතිරෝධය අඩු නම් එහි ගමන් කරන විදුලි ධාරාව වැඩි වේ.

ප්‍රතිරෝධ මනිනු ලබන්නේ ඕම් (Ω) නම් ඒකකයෙනි. විද්‍යුත් පරිපථයක ප්‍රතිරෝධය පෙන්වනු ලබන්නේ  සංකේතයෙනි. එසේම, මෙය ධාරාව ගලායාම සීමා කිරීමට භාවිතා කරන විද්‍යුතයෙන් ක්‍රියා නොකරන උපාංග හෙවත් නිෂ්ක්‍රිය සංරචකයකි.

## ප්‍රතිරෝධක අභ්‍යන්තර හරස්කඩ




## ප්‍රතිරෝධක වර්ග කිරීම Types of Resistor

පහත රූප සටහන මගින් විවිධ වර්ගයේ ප්‍රතිරෝධ නිරූපණය කරනු ලබයි.




DISHANT YAPA

උදාහරණ. ප්‍රතිරෝධයේ වර්ණ දුඹුරු, කලු සහ තැඹිලි සහ රිදී නම්, දුඹුරු සඳහා 1 අගය ද, කළු සඳහා 0 අගය ද, තැඹිලි සඳහා $10^3$ ගුණාකාර අගය ද යොදා ගනු ලැබේ. ඉන් පසු එය පහත පරිදි දිස් වනු ලැබේ.

$$10 \times 10^3 = 10,000$$

ප්‍රතිරෝධයේ අගය x Tolerance තීරුවේ අගය = 10KΩ x 10% = 1000Ω හෙවත් 1KΩ ක +/- අගයක් එයට එකතු කරනු ලැබේ. එනම් එම ප්‍රතිරෝධය ක්‍රියා කරනු ලබන සැබෑ පරාසය 9KΩ සහ 11K අතර වේ.

## Activity

ප්‍රතිරෝධයේ නිවැරදි වර්ණය ඇතුළත් කරන්න.

| ප්‍රතිරෝධයේ අගය | පළමු වර්ණය | දෙවන වර්ණය | තුන්වන වර්ණය |
|---|---|---|---|
| 100 Ω | | | |
| 3.6 kΩ | | | |
| 7.5 k | | | |
| 820 k | | | |
| 2.2 M | | | |

ප්‍රතිරෝධයේ නිවැරදි අගයන් ඇතුළත් කිරීමෙන් පහත වගුව පුරවන්න.


Black, Brown, Brown, Silver ____________________


Red, Red, Red, Gold ____________________


Brown, Red, Black, Silver ____________________


Yellow, Red, Yellow, Silver ____________________


Blue, Green, Red, no band ____________________


Black, Gray, Green, Gold ____________________


Gray, Blue, Orange, Silver ____________________


Violet, Violet, Brown, no band ____________________

DISHANT YAPA

# ධාරිත්‍රක/ කොන්ඩෙන්සර් Capacitors



ධාරිත්‍රක යනුවෙන් හැඳින්වෙන්නේ ඉලෙක්ට්‍රොනික උපකරණ වල විද්‍යුත් ශක්තිය ගබඩා කර තබන හෙවත් තැන්පත් කර තබන කුඩා භාජනයකට සමාන පර්යන්ත දෙකක් සහිත උදාසීන ඉලෙක්ට්‍රොනික උපාංගයකි.
A capacitor is a device that stores electrical energy in an electric field. It is a passive electronic component with two terminals.

ධාරිත්‍රකයක් සකස් කරනු ලබන්නේ සන්නායක තහඩු දෙකක් සහ පරිවාරක තහඩු දෙකක් ආශ්‍රයෙනි. සන්නායක තහඩු වල ක්ෂේත්‍රඵලය අනුව ධාරිතා අගය තීරණය කරනු ලබයි.
Capacitance of a capacitor is the ability of a capacitor to store maximum charge on its plates.



මෙම ධාරිත්‍රකයේ ධාරිතාව මනිනු ලබන ඒකකය වනු යේ ෆැරඩේයයි. ෆැරඩේ යනු විද්‍යුත් චුම්බක ප්‍රේරණය ලොවට දායාද කරනු ලැබූ ඉංග්‍රීසි විද්‍යාඥයකු වන මයිකල් ෆැරඩේය.
The capacitance of this capacitor is measured by Farad. Michael Faraday, an English scientist who pioneered the world of electromagnetic induction in 1831.

ධාරිත්‍රක තුල ගබඩා වනු ලබන ධාරිතාව ඉතා කුඩා අගයක් වනු නිසා මෙම ඒකකය Mf සහ μf යන (මයික්‍රො ෆැරඩ්) ඒකක සහ PF (පීකො ෆැරඩ්) මගින් ද දක්වනු ඇත.

## Basics of a Capacitor:

- The value of the capacitor = MFD, NFD or PFD
- Voltage = V
- Accuracy = %
- Product type
- Temperature




DISHANT YAPA

## ට්‍රාන්සිස්ටරය (Transistor)



මෙම උපංගය මුලින්ම සොයා ගනු ලැබුයේ ඇමරිකාවේ බෙල් නම් පරීක්ෂණා ගාරයේ දී ජෝන් බාඩීන්, වෝල්ටර් බ්‍රැටේන් සහ විලියම් ශ්ෂෝක්ලි නම් විද්‍යාඥයින් විසිනි. 1948 වර්ෂයේ දී මෙම ට්‍රාන්සිස්ටරය වෙළඳපොළට පැමිණීමත් සමඟ ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ මහත් වූ විපර්යාසයෙන් සිදු විය. Transistor was first discovered by scientists John Bardeen, Walter Brattain and William Shockley at the Bell Laboratory in the United States. With the introduction of this transistor into the market in 1948, a great change took place in the field of electronics.



ට්‍රාන්සිස්ටරය යනු “Transfer + Resistance” පදය වචන දෙකක එක් වීමෙන් ගොඩ නැගුණු වචනයකි. මෙයින් අදහස් වනුයේ ඉලෙක්ට්‍රෝන ධාරාවක් ගමන් කර වීමේ දී ධාරාවට ප්‍රතිරෝධයක් දැක්වීමයි. අර්ධ සන්නායක යනු ඊට තවත් නමකි. "Transistor" is a combination of the two words "Transfer + Resistance". This means that a current of electrons resists the current flowing through it. Semi conductor is another name for it.

එනම්, ට්‍රාන්සිස්ටරයක් යනු ඉලෙක්ට්‍රොනික සංඥා වල විස්තාරණය වෙනස් කර ගැනීමට භාවිතා කරනු ලබන අර්ධ සන්නායක වලින් තැනූ උපාංග යකි. එය බාහිර පරිපථයකට සම්බන්ධ කිරීම සඳහා අඩුම තරමින් පර්යන්ත තුනක අර්ධ සන්නායක කොටස් කිහිපයකින් සෑදී ඇත. That is, a transistor is a device made of semiconductors used to change the amplitude of electronic signals. It is made up of several semiconductor parts at least three terminals to connect to an external circuit.

DISHANT YAPA

## ට්‍රාන්සිස්ටර වර්ග Types of Transistors

පහත රූප සටහන් මගින් පෙන්වා දී ඇත අයුරින් ට්‍රාන්සිස්ටර වර්ග දෙකක් තිබේ. As shown in the diagram below, there are two types of transistors. Namely bipolar junction transistors (BJT) and field-effect transistors (FET).



# 4 Circuit Troubleshooting

## පරිපථ දෝශ නිරාකරණය



## දෝෂ නිරාකරණය Circuit Troubleshooting

දෝෂ නිරාකරණය යනු අක්‍රිය උපකරණවල ගැටළුවක් හුදකලා කර නිවැරදි කිරීමේ ක්‍රියාවලිය වන අතර එමගින් එය අපේක්ෂිත කාර්යසාධන මට්ටමට නැවත පැමිණීම සිදු කරනු ලබයි. දෝෂ නිරාකරණ ක්‍රියාවලියට ක්‍රමානුකූල ව දෝෂ සෙවීමේ ප්‍රවේශයක් අවශ්‍ය වේ.

පරිපථයක් තුල වරදක් සිදු වූ විට, එය කරුණු දෙකක් මත සිදුවිය හැකිය:

1. උපකරණ කිසි සේත් ක්‍රියා නො කරයි.The equipment does not work at all
2. උපකරණ අසාමාන්‍ය ලෙස ක්‍රියා කරයි. The equipment works abnormally

දෙවන වර්ගයේ දෝෂ තවදුරටත් පහත පරිදි බෙදිය හැකිය:

1. නිරන්තර දෝෂයක් හෝ අක්‍රිය වීම. Constant error or malfunctioning
2. අතරමැදි දෝෂ. Intermittent errors - external noise pick-up, heat, shock, increase in humidity, etc.

පරිපථයක් තුල වරදක් සිදු වූ විට එම උපකරණ කිසි සේත් ක්‍රියා නො කරයි එහි ඇති දෝෂය හඳුනා ගැනීම සඳහා පහත ක්‍රමවේද යොදා ගනු ලබයි.

- Check Power විදුලි බලය ඇති දැයි පරීක්ෂා කරන්න
- Check Wiring වයර් රැහැන් කැඩී ඇති දැයි පරීක්ෂා කරන්න
- Check Short-circuit පරිපථය සංවෘත වී ඇති දැයි පරීක්ෂා කරන්න
- Check broken wires කැඩුණු වයර් ඇති දැයි පරීක්ෂා කරන්න
- Check burnt-out components පිළිස්සුණු සංරචක ඇති දැයි පරීක්ෂා කරන්න



දෝෂ නිරාකරණය සිදු කරනු අයුරු පහතින් පෙන්වා දී ඇත.

## සෑම විටම බලශක්ති ප්‍රභව පරීක්ෂා කරන්න Always check the power source

පරිපථ පරීක්ෂණ පුවරුව මතට multimeter යේ probes තබා එහි සාදා ඇති පරිපථය තුලට විද්‍යුතය ලැබී ඇති දැයි පරීක්ෂා කර බැලීම සිදු කළ යුතු වේ.




එහි දී තවදුරටත් විද්‍යුතය නො ලැබේ නම්, battery pack ඒක හා සම්බන්ධ වී ඇති switch on/ off වී ඇති දැයි සොයා බැලීම සහ ඒම සම්බන්ධයක වයර තුල අභ්‍යන්තර කම්බි කැඩී තිබීම හඳුනා ගත හැකි වේ.

DISHANT YAPA

## Lithium Polymer Batteries (Li-Po)

3.7V වෝල්ටීයතා වර්ධක වලින් මෙය ලබා ගත හැකි අතර, අනෙකුත් බැටරි හා සාපේක්ෂව හොඳ ධාරිතාව තිබෙන නිසා රොබෝ තාක්ෂණයේ භාවිතය සඳහා වඩාත් ජනප්‍රිය බැටරි වර්ගයක් බවට පත්වෙමින් තිබේ.




lipo battery 5000mAh

The important parts of a LiPo battery.




වර්තමානයේ රොබෝවරුන් සඳහා වඩාත් පොදු බලශක්ති ප්‍රභවයන් ඒකාබද්ධ කරන ලද බැටරි වර්ගයකි. Boston Dynamics හි ප්‍රමුඛතම මානවරූපී රොබෝ යන්ත්‍රය වන Atlas හි නවතම පුනරාවර්තනය, විදුලි ය හැනක් සඳහා මුල් පිටපතේ අවශ්‍යතාවය ප්‍රතිස්ථාපනය කරන 3.7 kilowatt hour (kWh) බැටරි ඇසුරුමකින් සමන්විත වේ.

Switching Mode
Power Supply For Robotics
AC 110/240V DC 12V/20A (240W)

Spot Battery Capacity = 605 Wh









What is Kwh ? - A kilowatt hour is a measure of energy used by an appliance if it were kept running for one hour.

DISHANT YAPA

## Step 2:

දිගින් දිගටම එම කොටස් දෙකම (රූප සටහනට අනුව) රත් කිරීමට මිලි මීටර් කීපයක solder එය මධ්‍යයට යොදා ගන්න. දැන් විදුලි පැස්සුම ඉවත් කර ස්වාභාවික ව එම ස්ථානය සිසිල් වීමට ඉඩ හරින්න. එවිට එය තත්පරයක් හෝ දෙකක් ඇතුළත සම්පූර්ණ වූ ජොයින්ට් එකක් දැකිය හැකි වේ.




## Step 3:

How to correctly identify a completed joint, සම්පූර්ණ වූ ජොයින්ට් ය නිවැරදිව හඳුනා ගන්නා අයුරු,




DISHANTYAPA

Good joints and Bad joints,









## Desoldering පෑස්සුම් ගැලවීම

Desoldering is the process of removing, soldering, or replacing electronic components in printed circuits. මුද්‍රිත පරිපථ තුල තිබෙන ඉලෙක්ට්‍රොනික උපාංග ගලවා ඉවත් කිරීම, එහි අලුත්වැඩියා හෝ ප්‍රතිස්ථාපන කටයුත්තක් සඳහා එහි ගල්වා තිබෙන මෙම ඊයම් ගැලවීමේ කාර්යය desoldering ලෙස හැඳින්වනු ලැබේ.

desoldering කිරීමේ දී ගත යුතු පියවර ලෙස රූප සටහනට අනුව desoldering සම්බන්ධතාවය භාවිත කරමින් PCB pad මත තිබෙන එම පෑස්සී තිබෙන එම ඊයම් කැබලි ඉවත් කර ගැනීම සිදු කර ගත යුතු වේ.



Desoldering Pump (Solder sucker)



DISHANT YAPA

# 5

# Movement of Robots

## රොබෝවරුන්ගේ චලනය අධ්‍යනය



Studying the movement of robots will be more important in designing a robotic machine. Humanoid robots, for example, are made to mimic real-world humans.

රොබෝවරුන්ගේ චලනය අධ්‍යනය කිරීම රොබෝ යන්ත්‍රයක් නිර්මාණය කිරීමේ දී වඩාත් වැදගත් වනු ඇත. උදාහරණයක් ලෙස මිනිස් (හියුමනොයිඩ්) රොබෝ යන්ත්‍ර සැබෑ ලොව මිනිසුන් අනුකරණය කර ගනිමින් නිපදවා ඇත.

එය තුල කෘත්‍රිම බුද්ධිය artificial intelligence සහ රොබෝ robotics තාක්ෂණය ඒකාබද්ධ කර ඇති අතර එම මිනිස් රොබෝ යන්ත්‍රවලට මිනිසුන් මෙන් බුද්ධිමත් සංවාද වල නිරත වීමට හැකියාව ඇත.

DISHANTYAPA

## රොබෝවරු යොදා ගන්නා රෝද වර්ග Types of wheels for robots

There are several different types of wheels available for robots, each with their own advantages and disadvantages. රොබෝවරුන් සඳහා නිර්මාණය කරන ලද විවිධ වර්ගයේ රෝද තිබේ, ඒවායින් එක් එක් ඒවායේ වාසි සහ අවාසි දැකිය හැකිය.

### Standard Wheels සම්මත රෝද

They can travel forward or in reverse but not side to side. ඉදිරියට හෝ ආපසු හැරවිය හැකි රෝද වලින් මේවා සමන්විත වනු ලබන අතර ඒවාට දෙපැත්තට ගමන් කළ නොහැකිය.





## Caster & Ball Wheels කැස්ටර් සහ බෝල් වර්ගයේ රෝද

මෙම වර්ගයේ රෝදවලට විවිධ ආනති ඔස්සේ ගමන් කළ හැකිය, එනම් ඔවුන්ට ඕනෑම දිශාවකට ගමන් කළ හැකිය.





## Mecanum Wheels මැකනම් වර්ගයේ රෝද



වෙනස් හැඩයක් ගනු ලබන මෙම මැකනම් රෝදය ටයරයක් නොමැති හැඩයක් ගනු ලබන අතර රබර් සහිත බාහිර රෝලර්යකින් මෙහි දාරයේ සම්පූර්ණ වට ප්‍රමාණය ආවරණය කර ඇත.

මේවා බහු දිශා රෝද වන අතර යමක් ගමන් කරවීමට යොදා ගනු ලබයි.

තවද මැකනම් රෝදය යනු ඕනෑම දිශාවකට ගමන් කිරීම සඳහා යොදා ගනු ලබන රෝදයක් වන අතර එය 1972 වර්ෂයේ දී නව නිපැයුම්කරු බෙන්ට් අර්ලන්ඩ් අයිලෝන් සොයා ගන්නා ලදී.







# 6 Parts of Robots

## රොබෝ යන්ත්‍රයක විවිධ කොටස්



## රොබෝ යන්ත්‍රයක විවිධ කොටස් Parts of the Robot

රොබෝවක් යනු භෞතික වස්තූන් සමඟ අන්තර් ක්‍රියා කිරීමට යම් හැකියාවක් ඇති යන්ත්‍රයකි. තවද එයට විද්‍යුත් වැඩසටහන්කරණය හරහා නිශ්චිත කාර්යයක් කිරීමට හෝ සම්පූර්ණ පරාසයක් තුල විවිධ කාර්යය සිදු කර ගනු ලබයි.




DISHANT YAPA

### Brain

ශරීරයේ සංවේදක මගින් ලබා දෙනු ලබන තොරතුරු වලට අනුව මොළය විසින් තීරණ ගනු ලබන අතර ඒවා ක්‍රියාවට නැංවීම ද සිදු කරනු ඇත. රොබෝ යන්ත්‍රය තුල ඇත පරිගණක කොටස මෙයට උදාහරණයක් වනු ඇත.



විවිධ වර්ගයේ සර්වෝ මෝටර සහ එහි මිල ගණන්




## How to use a servo motor සර්වෝ මෝටරය භාවිතා කරන අයුරු

ආර්ඩියුනෝ පරිපථය විසින් ලබා දෙනු ලබන ප්‍රතිධාන සංඥා වලට අනුව මෙය ක්‍රියාත්මක වනු ලබයි. මෙම උපාංගය තුල මොටර් ඩ්‍රයිවර් සහ ප්‍රතිපෝෂණය පරිපථ අඩංගුව ඇත. PWM වර්ගයේ වර්ග තරංග සහිත සංඥා මෙම උපාංගයට ලැබෙන අතර 20 මිලිතත්පර අතර කාලයක් LOW අගයක් සහිත එක් චක්‍රයක් සඳහා ගනු ලබයි. තවද මිලිතත්පර 1 කත් 2 කත් අතර අගයන් ඉහල අගයක් ලෙස පෙන්වා දෙනු ලබයි.




අංශක 0 ත් 180 ත් අතර අගයන් මිලි තත්පර 1 දී අංශක 0 මෙන්ම මිලි තත්පර 2 දී අංශක 180 පෙන්වා දිය හැකිය.




DISHANTI YAPA

# 7 Sensors of the Robots

## රොබෝ සංවේදක කොටස්



## සංවේදකයක් යනු කුමක්ද? What is a sensor?

සංවේදකය යනු භෞතික ප්‍රමාණය physical quantity මැනීමේ උපකරණයක් ලෙස හඳුන්වා දිය හැකිය. තවද එය හරහා පරිගණකයකට හෝ ඉලෙක්ට්‍රොනික උපකරණයකට කියවිය හැකි පරිදි, ලබා ගත් මිනුම් සම්ප්‍රේෂණය කිරීම සිදු කර දෙනු ලබයි. මෙම සංවේදක කාර්, ගුවන් යානා, රොබෝ යන්ත්‍ර සහ වෛද්‍ය උපකරණ වලින් සොයාගත හැකිය.

Sensors - සංවේදක තත්‍ය කාලීන තොරතුරු සැපයීම සඳහා භාවිතයට ගනු ලබයි. Sensors are used to provide real time information on the task environment.







DISHANT YAPA




ඔබගේ රොබෝ යන්ත්‍රට වටාපිටාව හඳුනා ගැනීමට අවශ්‍ය නම්, ඔබට සංවේදකයක් එක් කිරීමට අවශ්‍ය වනු ඇත. මෙහි දී එම සංවේදකය තෝරා ගැනීමේ දී ඔබගේ නිශ්චිත අරමුණු මත භාවිතයට එය ගනු ලැබිය යුතුයි.

තවද ඒවා ආර්ඩියුනෝ සංවේදකය ලෙස මිල දී ගැනීමේ දී මොඩියුල ලෙස දැකිය හැකි අතර භෞතික වැඩසටහන්ගත කළ හැකි පරිපථ පුවරුව වලින් එය සමන්විත වේ. ඔබට සියලුම පරිගණක කේත එම භෞතික පුවරුවට ලිවීමට හා upload කිරීමට ද පුළුවන.




DISHANT YAPA

මෙම සංවේදකයේ ක්‍රියාකාරීත්වය වවුලකු විසින් තම ගමන්මග සොයා ගනු ලබන ක්‍රමවේදයට සමාන වේ.




අතිධ්වනි සංවේදකයේ ක්‍රියාකාරීත්වය සඳහා උදාහරණ

## HC-SR04 ultrasonic sensor අතිධ්වනික සංවේදකය

The ultrasonic sensor has two parts, අතිධ්වනික සංවේදකයට කොටස් දෙකක් ඇත,

- A transmitter that sends out a signal that humans cannot hear. මිනිසුන්ට ඇසෙන්නේ නැති සංඥාවක් නිකුත් කරන සම්ප්‍රේෂකයක්.
- A receiver that receives the signal after it has bounced off nearby objects. අසල ඇති වස්තූන් ඉවතට ගිය පසු සංඥා ලබා ගන්නා ග්‍රාහකයෙක්.

මෙම ජනප්‍රිය අතිධ්වනික දුර සංවේදකය මඟින් සෙන්ටිමීටර 2 සිට 450 දක්වා ස්ථාවර හා නිවැරදි දුර මැනීම් ලබා දේ. එහි අංශක 15 ට අඩු අවධානයක් සහ මිලිමීටර් 2 ක පමණ නිරවද්‍යතාවක් ඇත.




DISHANT YAPA

# 8

# Microcontrollers for Robots

## රොබෝ යන්ත්‍ර සඳහා භාවිතා කරන මයික්‍රොකොන්ට්‍රෝලය



## ක්ෂුද්‍ර පාලකයක් යනු කුමක්ද? What is Microcontroller

මයික්‍රොකොන්ට්‍රෝලර් යනු කාර්යාල උපකරණ, රොබෝ යන්ත්‍ර, ගෘහ උපකරණ, මෝටර් වාහන සහ වෙනත් උපකරණ ගණනාවක කාවැද්දූ පද්ධතිවල ක්‍රියාකාරිත්වය පාලනය කිරීම සඳහා නිපදවන ලද සම්පීඩිත ක්ෂුද්‍ර පරිගණකයකි.

මයික්‍රොප්‍රොසෙසර් (ක්ෂුද්‍ර සකසනය) පරිගණක තුල ක්‍රියාත්මක වුවද මයික්‍රොකොන්ට්‍රොලර් නම් උපාංගය ක්‍රියාත්මක වනු ලබන්නේ "embedded" කරනු ලැබූ විවිධ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන උපාංග තුලය.

එම නිසා මෙම ක්ෂුද්‍ර පාලකය, ක්ෂුද්‍ර පාලක චිපයක් මත ඇති පරිගණකයක් ලෙස අර්ථ දැක්විය හැකිය. තවද, එම තනි චිපය මත ගොඩනගා ඇති මතකය, CPU සහ RAM ආදිය දැකිය හැකිය. එහි දී එහි ඇති පාද මගින් ඩිජිටල් සහ ඇනලොග් මෙහෙයුම් සිදු කළ හැකිය.

මූලික වශයෙන් මයික්‍රොප්‍රොසෙසරයක් යනු පරිගණකයේ මොළය වන අතර මයික්‍රෝ පාලකය යනු මොළය සහිත මාංශ පේශි වන අතර එයට තනිවම බොහෝ කාර්යයන් සිදු කර ගත හැකිය.




DISHANT YAPA

## ක්ෂුද්‍ර පාලකයේ අභ්‍යන්තරය Inside the microcontroller

ක්ෂුද්‍ර පාලකය සතුව සන තත්ත්වය මතකයක් ඇති අතර එහි ඇති පාද භාවිත කරමින් අවශ්‍ය වාර ගණනක් වැඩසහන්ගත කිරීමට හැකියාව තිබේ. එම නිසා ඒවා General Purpose Input Output pins හෙවත් GPIO පාද ලෙස හඳුන්වයි. මේවා 8 බිට්, 16 බිට්, 32 බිට් සහ 64 බිට් යන ආදී සැකසුම් වලින් සමන්විත වේ.

ක්ෂුද්‍ර පාලකය තුල සාමාන්‍යයෙන් ක්ෂුද්‍ර සකසනයක් තුල දැකිය හැකි ලෙස පාලක ඒකකයක් සහ ගණිත සහ තාර්කික ඒකකයක් හෙවත් මධ්‍යම සැකසුම් ඒකකය අඩංගු වේ. එනම් මෙම ක්ෂද්‍ර සකසනයක් තුල දත්ත සැකසුම් කාර්යය හෙවත් සියලුම ගණිත කර්ම සිදු කරනු ලබයි.

මීට අමතරව RAM සහ ROM මතක පමණක් නොව ආදාන/ප්‍රතිදාන ඒකක වලින්ද සමන්විත වේ. එනම් කුඩා චිපයක් ලෙස දැකිය හැකි මෙම ක්ෂුද්‍ර පාලකයට පරිගණකයක් ලෙස තනිව ක්‍රියාත්මක විය හැකිය.

Arduino, Raspberry Pi, Node MCU, මැජික්බිට් සහ micro:bit ආදිය ක්ෂුද්‍ර පාලක සඳහා උදාහරණ වේ.



Arduino



Raspberry Pi



Node MCU



Magicbit




micro:bit



STM32 "blue pill"

DISHANT YAPA

## Applications of microcontrollers



# 9

# Arduino for Robots

## රොබෝ යන්ත්‍ර සඳහා ආර්ඩුයිනෝ භාවිතය



## ආර්ඩුයිනෝ යනු කුමක්ද? What is Arduino?



මෙම ක්ෂුද්‍ර පාලකය වර්තමානයේ වඩාත් බහුලව භාවිතයට ගනු ලබයි. ඒ අතරින් ආර්ඩුයිනෝ යූනෝ වඩාත් ජනප්‍රිය වූවකි. 2005 වර්ෂයේ දී ඉතාලි ජාතික මැසීමෝ බැන්සි Massimo Banzi සහ ඩේවිඩ් කුආර්ටියල්ස් David Cuartielles විසින් මෙම ආර්ඩුයිනෝ නම් වූ උපාංගය මුලින් ම සොයා ගනු ලබයි.

ආර්ඩුයිනෝ යනු දෘඩාංග hardware හා මෘදුකාංග software එකතුවක් තුළ ගොඩනගා ඇති පහසුවෙන් භාවිතා කළ හැකි පරිපථ පුවරුවකි. ක්ෂුද්‍ර පාලකය සහිත පුවරුව ආර්ඩුයිනෝ IDE (Integrated Development Environment) නම් මෘදුකාංගය භාවිතයෙන් ක්‍රමලේඛනය කළ හැකිය. එනම්, පරිගණක කේත ලිවීම සහ upload කිරීම කරයි.

ඔබට අවශ්‍ය කාර්යයට ගැලපෙන පරිදි මෙම ආර්ඩුයිනෝ පුවරුව වෙනස් කළ හැකිය. මෙය සිදු කිරීම සඳහා ඔබ පරිගණක උපදෙස් මාලාවක් ලෙස හැඳින්වෙන උපදෙස් මාලාවක් ක්ෂුද්‍ර පාලකයට යැවිය යුතුය. මෙම උපදෙස් ලිවීම සඳහා $C^{++}$ භාෂාව ආර්ඩුයිනෝ ක්‍රමලේඛන භාෂාව ලෙස භාවිතා කරන අතර එය විවෘත මූලාශ්‍ර මූල කෘති වේදිකාවකි.

ආර්ඩුයිනෝ මෘදුකාංගයේ විශේෂාංගය නම් එය සරල, පහසු සහ මිල අඩු වන අතර මයික්‍රොසොෆ්ට් වින්ඩෝස්, ඇපල් මැක් සහ ලිනක්ස් වැනි ඕනෑම මෙහෙයුම් පද්ධතියක පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි වීමයි.The Arduino software's feature is that it is simple, easy, and inexpensive, and can easily run on any operating system, such as Microsoft Windows, Apple Mac and Linux.

මෙම වැඩසටහනේ දී අපි භාවිතා කරන්නේ ඉගෙන ගැනීමට හැකි පහසුම ක්ෂුද්‍ර පාලක පරිපථය වන ආර්ඩුයිනෝ යූනෝ නම් පරිපථ පුවරුවයි.

Microsoft Windows Apple Mac Linux

DISHANT YAPA

# 10

# Magicbit microcontroller for robotics

## රොබෝ යන්ත්‍ර සඳහා මැජික්බිට් මයික්‍රොකොන්ට්‍රෝලය




## මැජික්බිට් යනු කුමක්ද? What is Magicbit?



මැජික්බිට් යනු කුඩා නමුත් ප්‍රබල උපාංගයක් වන අතර එය ක්‍රමලේඛගත කර ඉලෙක්ට්‍රොනික මෙන්ම රොබෝ තාක්ෂණික වැඩසටහන් සඳහා භාවිතා කළ හැකිය. තවද එය IoT මත පදනම්ව විවිධ ඉලෙක්ට්‍රෝනික උපකරණය ක්‍රියාත්මක කළ හැකි ලෙස නිපදවන ලද උසස් තත්ත්වයේ ඇති ලෝකයේ රටවල් 38 කට අධික ප්‍රමාණය වෙළඳපොලට විවෘත කර දී දේශීය මෙන්ම ජාත්‍යන්තරව සම්මාන හිමි වූ ශ්‍රී ලාංකික නිෂ්පාදනයකි.

මෙම මයික්‍රොකන්ට්‍රෝලය උපාංගය ශ්‍රී ලංකාව තුලම නිපදවා ගැනීමට හැකි වීම පිටුපස අප දේශීය ඉංජිනේරුවන් තිදෙනෙකු ඇත. මිගාර අමිත්තෝදන, අනුරුද්ධ තෙන්නකෝන් සහ අකලංක ද සිල්වා වන ඔවුන් මොරටුව විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය හදාරා ඇති අතර එහි දී ලැබුණු පන්නරය මෙම නිර්මාණය කළ එළි දැක්වීමට හේතු විය.




මෙම උපාංගය භාවිතයෙන් Programming, robotics, electronics සහ internet of things වැනි විවිධ ක්ෂේත්‍ර තුල ඕනෑම නිර්මාණ බිහි කිරීමට හැකියාව තිබේ. 2021 වර්ෂයේ දී ලොව ප්‍රසිද්ධ Kickstarter නම් වෙබ් අඩවිය හරහා මෙම මැජික්බිට් ලෝකයට කල එළි දැක්වීම සිදු වූ අතර ඇමරිකාවේ STEM.ORG මගින් ලොව පුරා ළමුන්ට නව නිපැයුම් කරණයට දිරි ගන්වනු ආයතනය මගින් දරුවන්ගේ නිර්මාණශීලී කුසලතා වර්ධනයට භාවිතා කළ හැකි උපකරණයක් ලෙස අනුමත වූ නිෂ්පාදනයකි. තවද 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ හොඳම startup විදිහට National Ingenuity Awards 2022 හිදී සම්මානයට පාත්‍ර වී ඇත.

මැජික්බිට් යනු සෑම කෙනෙකුටම මයික්‍රොකොන්ට්‍රෝලරයක් භාවිතයෙන් ක්‍රමලේඛනය ඉගෙනීම ආරම්භ කිරීම සඳහා වූ සියලුම ඉලෙක්ට්‍රොනික උපාංගයකි. එය සංවේදක සමග ඉතා පහසුවෙන් සම්බන්ධ කළ හැකි අතර mblocks සහ scratch වැනි දෘශ්‍ය කේත වැඩසටහන් සමග හොඳින් ක්‍රියා කරනු ඇත. Wi-Fi සහ Bluetooth සම්බන්ධතා මෙහි ඇති අතර LED, OLED, Buzzer භාවිතයෙන් විවිධ නිර්මාණ සිදු කරමින් Robotics සහ IoT ව්‍යාපෘති ආරම්භ කිරීමට සුදුසුම වේදිකාව.

DISHANT YAPA

මැජික්බිට් නිර්මාණය වී ඇත්තේ ESP 32 නම් වූ ක්ෂුද්‍ර පාලක චිපය පදනම් කරගනිමිනි. එසේම එම චිපය ආර්ඩුයිනෝ මත ක්‍රියා කරනු ලබන අතර ආර්ඩුයිනෝ IDE මෘදුකාංගය භාවිතයට ගනු ලැබීම මෙහි දී සිදු කරනු ඇත.

බැලූ බැල්මට මෙය කුඩා උපාංගයක් ලෙස පෙන්නුම් කලත් මැජික්බිට් යනු දෘඨාංග සහ මෘදුකාංග වලින් සමන්විත උපාංගයකි. මෙයට නවීන තාක්ෂණය උපයෝගී කර ඇති අතර වසර 10 කට වඩා අඩු වයසක් ඇති කුඩා දරුවෙකුට වුවද රෙබෝ වැඩසටහන් නිර්මාණය කිරීමට තරම් මෙය සරල උපාංගයකි.

## මැජික්බිට් ක්ෂුද්‍ර පාලකයේ ඇති වැදගත්කම් Highlights of Magicbit Microcontroller

- මැජික්බිට් යනු කුඩා දරුවෙකු පටන් ඉතා හොඳ දැනුමක් ඇති තාක්ෂණික ශිල්පියෙකු දක්වා පරාසයක සිටින ඕනෑම අයෙකුට රොබෝ තාක්ෂණික උපාගයන් සමඟ වැඩ කල හැකි වීම.

- මෙම ක්ෂුද්‍ර පාලක පරිපථය microcontroller නිර්මාණය කළ ඇති ෂඩාස්රාකාර hexagon හැඩයට අනුව විවිධ අමතර මොඩියුල බ්‍රෙඩ් බෝඩ් breadboard සහ ජම්පර වයර් jumper wire නොමැතිව ඉතා පහසුවෙන් සම්බන්ධ කිරීමට ඇති හැකියාව නිසා.

